www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ෆැසිස්ට්වාදය හා මහ යුදෙව් සංහාරය

## ඩැනියෙල් ගෝල්ඩ්හාගන්ගේ *Hitler's Willing Executioners* (හිට්ලර්ගේ ආසක්ත අලුගෝසුවෝ) කෘතිය පිලිබඳ විවේචනාත්මක විචාරයක්

**Fascism & the Holocaust**
**A critical review of Daniel Goldhagen's Hitler's Willing Executioners**

*පහත පලවන්නේ එක්සත් ජනපදයේ සමාජවාදී සමානතා පක්ෂයේ ජාතික ලේකම් ඩේවිඩ් නෝර්ත් 1997 අප්‍රේල් 17 දා නැගෙනහිර ලැන්සිග් හි මිචිගන් රාජ්‍ය විශ්වවිද්‍යාලයේ දී පැවැත් වු දේශනයකි. 1997 මැයි 30 කම්කරු මාවත පුවත්පතේ පලවූ ලිපිය කොටස් හතරකින් මෙහි පලකරමු.*

### දෙවන කොටස

### නූතන දේශපාලන යුදෙව්-විරෝධයේ නැගීම

යුදෙව් විරෝධය සහතිකෙන් ම නූතන ප්‍රපංචයක් නොවේ; ජර්මනියට සීමිත වූවක් ද නොවේ; යුරෝපීය රටවල් ගනනාවක එය පැතිර ඇත. එහෙත් යුදෙව් විරෝධය පැහැදිලි හා බලගතු දේශපාලන ව්‍යාපාරයක් ලෙස පැන නැංගේ දහනව වන සිය වසේ අවසාන තුනෙන් පංගුව තුලය. යුදෙව් විරෝධී දේශපාලන ව්‍යාපාරයන්ගේ වර්ධනය නූතන කාර්මික ධනවාදයේ වර්ධනයට සම්බන්ධ වූ සංකීර්න සමාජ සන්තතීන් තුල මුල් බැස ඇතැයි යන්න වාදයට භාජනය කල නො හැකි ය.

මේවායින් ඉතාම වැදගත් එක වූයේ අලුත් හා අතිශයින් බලගතු වූ සමාජ පන්තියක පැන නැගීම ය. 1870 ගනන් වන විට, විශේෂයෙන් ම 1871 පැරිස් කොමියුනයෙන් පසුව, වඩවඩාත් සමාජවාදී දෘෂ්ටිවාදයේ බලපෑමට හසුවූ කාර්මික කම්කරු පන්තියක පැවැත්ම ධනේශ්වර අවශ්‍යතාවන්ට විභව වශයෙන් ම විප්ලවවාදී තර්ජනයක් ලෙස හඳුනා ගන්නා ලදී.

මෙම තර්ජනයට ප්‍රතිචාර ලෙස වරප්‍රසාදිත පන්තීහු - ධනේශ්වර පන්තිය සහ ඒ වන විටත් සැලකිය යුතු ඉඩම් හිමි කොටස් - පවත්නා සමාජ පර්යාය ආරක්ෂා කිරීම සඳහා මහා පදනමක් වගා කිරීමට මං සෙවූහ. මෙයට පරස්වාවකව, සමාජවාදී කම්කරු පන්තියට එරෙහිව ධනවාදය ආරක්ෂා කිරීම සඳහා ජනතා පදනම පැන නැගුනේ නූතන කාර්මික වර්ධනයේ සන්තතීන් විසින් දිගින් දිගට ම සමාජ හා ආර්ථික තත්වයට යටින්-වල කැපීමට පාත්‍ර කෙරුනු මධ්‍යම පන්තියේ කොටස් තුලිනි.

ජර්මනියේ 1873 දී තද බල අවපාතයක් එලඹීම ද සමඟ කොටස් වෙලඳ පොල බිඳී මධ්‍යම පන්තික ආයෝජකයන්ගේ ඉතිරි කිරීම් මහා විනාශයකට පාත්‍ර කලේ ය. බිස්මාක්ගේ නිදහස් වෙලඳාම හා ලෙයිසස්-ෆෙයාර් (රාජ්‍ය නිර්බාධ) පිලිවෙත්වලට විරුද්ධ මහජන නැගීම සැලකිය යුතු වේගයකින් වර්ධනය විය. යුදෙව් සමපේක්ෂකයන් සැලකිය යුතු සංඛ්‍යාවක් කොටස් වෙලඳ පොල වටා වූ සෝලිවල පැටලී සිටීම යන අවාසනාවන්ත කාරනාව නො මග ගිය මධ්‍යම පන්තික කොටස්වල කෝපයට කේන්ද්‍රයක් සැපයී ය. මෙම තත්වය තුල නූතන ධනවාදයේ නපුරුකම් සමග යුදෙව් ජාතිකයා අනන්‍ය කිරීම නව දේශපාලන අර්ථභාරයක් අත් කර ගති.

සත්තකින් ම සුලු ධනේශ්වර ජනකාය මෙවන් ආයාචනයන්ට නැමීමට තිබුනු ඉඩකඩ දීර්ඝ කාලීන අගතීන් විසින් සුකර කරනු ලැබී ය. එහෙත් ධනේශ්වර සංවර්ධනය විසින් නිර්මානය කරනු ලැබු නිශ්චිත වෛෂයික කොන්දේසි මෙම පැරනි අගතීන් අතිශය ප්‍රතිගාමී මාවත් දිගේ මෙහෙයවා ඒවාට අති-අසාමාන්‍ය විනාශකාරී බලපෑමක් අත් කර දුනි.

ඔටෝ ග්ලගෝ, රුඩොල්ෆ් මෙයියර්, විල්හෙල්ම් මාර් වැනි යුදෙව්-විරෝධී ලේඛකයෝ යුදෙව්වන් ධනේශ්වර කෑදරකමේ සදේහතාව ලෙස විස්තර කර ජර්මානු මධ්‍යම පන්තිය තුල වියරු වැටුනු කොටස් - සුලු වෙලෙන්දන්, හස්ත කර්මාන්තකරුවන් සහ රැකියා විරහිතයන් -අතර සෑහෙන ශ්‍රාවකත්වයක් අත් කර ගත්හ.

දහනව වන සියවස පුරා යුදෙව් ජනයාගේ සමාජ තත්වයන් සැලකිය යුතු අන්දමින් වර්ධනය වීම ජර්මානු මධ්‍යම පන්තියේ ව්‍යාකූල ධනේශ්වර විරෝධී හැඟීම් යුදෙව්වන්ට එරෙහි වෛරයක් තුලට හැරවීමේ ප්‍රයත්න සුකර කලේ ය. "1870 ගනන් වන විට, මුලුමනින්

ම ධනේශ්වරකරනය කරනු නො ලැබූ සමාජයක උච්චතම ධනපති පන්තිය ලෙස ද, ඒ වන විටත් නවීකරනය කරනු නොලැබූ ජාතියක නවාරම්භක නව්‍යකාරකයන් ලෙස ද යුදෙව්වන් ඉස්මතු වූ" (3) බව රොබට් විස්ට්‍රිච් නැමති ඉතිහාසඥයා ලියයි.

විස්ට්‍රිච් විසින් සපයා ඇති සංඛ්‍යා ලේඛන අනුව, 1882 දී බැංකු හා කොටස් වෙළඳ පොලවල නියුක්ත සේවකයන්ගෙන් සියයට 22ක් ම යුදෙව්වෝ වූහ. ජර්මන් ජන ගහනයෙන් සියයට එකකට නො වැඩි සංඛ්‍යාවක් යුදෙව්වන් වූ තතු තුල ඔවුහු බැංකු සහ නය ආයතන වල අයිතිකරුවන් අතුරෙන් 43.25%ක් ම නියෝජනය කලහ. බර්ලිනයේ බ්ලයික්රෝඩර්, හැම්බර්ග්හි වෝර්බුර්ග්, කොලන්හි ඔපන්හයිට් සහ ෆ්‍රැන්ක්ෆර්ට්හි ස්ක්‍රෝදර් වැනි විශාලතම බැංකු යුදෙව්වන් විසින් පාලනය කරනු ලැබී ය. ජර්මානු කර්මාන්තවල ප්‍රධාන අංශ දහයක කලමනාකාර මන්ඩලයන්හි සාමාජිකයන්ගෙන් සියයට 25ක් ම යුදෙව්වන් වූ බව 1900 ගනන් වල ආරම්භයේ දී වර්නර් සොම්බාට් ප්‍රකාශ කලේය.

ජර්මානු යුදෙව්වන්ගේ සාර්ථකත්වයේ තවත් වැදගත් ලක්ෂනයක් වූයේ නිපුන වෘත්තීන්හි ඔවුන්ට තිබුනු ප්‍රමුඛ තත්වය යි. 1882 වන විට සියලු වෛද්‍යවරුන්ගෙන් සියයට 11.7ක්, පුවත් පත් කලා වේදීන්ගෙන් සියයට 8.6ක් සහ නීතිඥයන්ගෙන් සියයට 7.9ක් යුදෙව්වෝ වූහ. මෙම සංඛ්‍යාවන් විසින් පෙන්නුම් කරන ලද පරිදි යුදෙව් තරුනයෝ විශාල පරිමාවකින් ඉහල අධ්‍යාපනය ලබා ගත්හ.

යුදෙව් තරගකාරිත්වය නො රිස්සූ ජර්මන් මධ්‍යම පන්තියේ අනාරක්ෂිත හැඟීම් අමතා යුදෙව් විරෝධී හැඟීම් ප්‍රචාරය කිරීම සඳහා මෙම සාර්ථකත්වය තව දුරටත් බිම සකසා දුනි.

පෙර සමයක දී යුදෙව් විරෝධී හැඟීම් සංකේන්ද්‍රනය වී තිබුනේ ආගම හා සම්ප්‍රදාය නිසා සෙස්සන්ගෙන් හුදෙකලා වූ යුදෙව් ජනයාගේ කේවලතාව යයි සලකන ලද දෙයට එරෙහිව ය. එහෙත් අලුත් යුදෙව්-විරෝධය පිහිටා ගත්තේ යුදෙව් ජනයා උවමනාවට වඩා ජාතික ජීවිතය තුලට කා වැදීමට එරෙහිව ය; මෙම විරෝධතා වලට 18 වන සියවසේ දී උමතු ලෙස පැතිර ගිය ව්‍යාජ විද්‍යාත්මක වර්ගවාදී න්‍යායන් විසින් රුකුල් දෙන ලදී. යුදෙව් ප්‍රාග්ධනයට එරෙහි අරගලය සඳහා කරන ලද කැඳවුම් ජර්මානු වර්ගය, යුදෙව් ආධිපත්‍යයෙන් ගලවා ගැනීම සඳහා කරන ලද අභියාචනයන් සමග බැඳී තිබුනි. " යුදෙව්වාදය" සහ ජර්මන්භාවය අතර අරගලය අනිවාරනීය "ලෝක ඓතිහාසික ඉරනමක්" යයි විල්හෙල්ම් මාර් නිවේදනය කලේ ය.

## යුරෝපයේ යුදෙව් විරෝධය

දේශපාලන යුදෙව් විරෝධය හුදෙක් ජර්මනියට සීමා වූයේ නැත. මීට සමාන්තර ප්‍රපංචයක් ප්‍රන්සයේ ද වර්ධනය විය. යුදෙව්-විරෝධය නැගී එන්නා වූ සමාජවාදී කම්කරු පන්තියට පමනක් නො ව, ලිබරල් ප්‍රජාතන්ත්‍රයට ද එරෙහිව මහජන සහය බලමුලු ගන්වා ගැනීමේ ලා ඉතාම සාර්ථක ක්‍රමය බව, එය ප්‍රචලිත කල අය විසින් දක්නා ලදී. යුදෙව් විරෝධයේ පදනම උඩ නව ජාතික සමමතියක් ගොඩනගා ගෙන ධනේශ්වර කාර්මීකරනය විසින් වර්ධනය කරන ලද්දා වූත් සමාජවාදය සඳහා ඉල්ලීම පදනම් කෙරුනා වූත් පන්ති භේදය අතික්‍රමනය කරන්නට අපේක්ෂා කෙරිනි. මෝරේස් නම් ප්‍රතිගාමී න්‍යාය ශාස්ත්‍රඥයා කම්කරු පන්තිය ජාතික ශරීරය තුලට යලිත් අන්තර්ගත කර ගැනීමේ මාධ්‍යයක් ලෙස යුදෙව්-විරෝධය සංකල්පනය කර ගති. "අප කම්කරු පන්තිය යටපත් කල යුතුය" යයි ඔහු ලිවීය. "මේ මිනිස්සුන්ට ආරක්ෂා කර ගැනීමට යමක් දිය යුතුය; අභිභවනය කිරීමට යමක් දිය යුතුය" මෙම ජාතික ව්‍යාපෘතිය යුදෙව්-විරෝධී විප්ලවයක් තුලින් සාක්ෂාත් කල යුතු විය. (5)

යුදෙව්-විරෝධය පාවිච්චි නො කොට ඒකාග්‍ර ජාතික සමගියක් ඇති කර ගත නො හැකි යයි පරම ප්‍රතිගාමී චාල්ස් මවුරාස් ප්‍රකාශ කලේ ය; පන්ති ප්‍රතිසතිතතා යටපත් කිරීමට එය ප්‍රයෝජනවත් වනු ඇත. "දෙවියා දුන්න යුදෙව්-විරෝධී ව්‍යාපාරය පහල වූයේ නැති නම් සෑම දෙයක් ම ඉටු කර ගත නො හැකි යයි ද අතිශයින් ම දුෂ්කර යයි ද පෙනේ. සෑම දෙයක් ම සූදානම් කිරීමට ද රැලි හැර මැද සරල කර ගැනීමට ද එය ඉඩ සලසා දෙයි. කෙනෙකු ජාතිමමත්වය නිසා දැනටම යුදෙව්-විරෝධියෙක් නො වූයේ නම්, ඉන් ලැබෙන අවස්ථාව පිලිබඳ හැඟීම නිසාම යුදෙව්-විරෝධියෙකු වනු ඇත." (6)

1894 දී ඩ්‍රේෆුස් නඩුව පුපුරා ගිය පසුබිම මෙයයි. ජර්මනියට ඔත්තු සැපයී යයි චෝදනා ලැබූ පෝසත් යුදෙව් හමුදා නිලධාරියා යුදෙව්-විරෝධී උද්ඝෝෂනයේ කේන්ද්‍රීය ඉලක්කය බවට පත් විය. "යුදෙව්වන් මරාපියව්!" යන හඬ නගමින් නගර 70ක ම හැඩිරල කැරලි ගැසුහ. යුදෙව් පූජනීය ස්ථානවලට (සිනගොග්) පහර දෙන ලදී. යුදෙව්වන්ට අයත් කඩසාප්පු කඩා, පුච්චා, මංකොල්ලකා, යුදෙව්වන්ට වීදිවල පහර දෙන ලදී.

ජර්මනියේ මෙන් යුදෙව්-විරෝධී ව්‍යාපාරය ප්‍රධාන වශයෙන් ම තම ජනතා සහාය ලබා ගත්තේ මධ්‍යම පන්තියෙනි. විශේෂයෙන් ම කුඩා කඩ කාරයන් හා විනාශයේ මුවවිට සැරූ වෙනත් සුලු ජාවාරම්කාරයන් ද තුලිනි. ඩ්‍රේෆුස් සිද්ධිය හෝ ප්‍රන්සයේ යුදෙව්-විරෝධී ව්‍යාපාර පිලිබඳ කිසිවක් මහාචාර්ය ගෝල්ඩ්හාගන්ගේ පොතේ දක්නට නැත.

## යුදෙව්-විරෝධය සහ සමාජ ප්‍රජාතන්ත්‍ර පක්ෂය

*හිට්ලර්ගේ ආසක්ත අලුගෝසුවෝ* නම් කෘතියේ කේන්ද්‍රීය ප්‍රස්තුතයක් වන්නේ ජර්මානු සමාජයේ සෑම කොටසක් විසින් ම යුදෙව්-විරෝධය සාර්වත්‍රිකව ම පිලිගන්නා ලද බවයි. ජර්මනිය තුල යුදෙව් විරෝධයට එරෙහි විපක්ෂයක් පැවතුන බවට අර්ථභාරී හෝ විශ්වාසී සාක්ෂි කිසිවක් ම නැතැයි කීමට තරම් දුර මහාචාර්ය ගෝල්ඩ්හාගන් ගමන් කරයි. ශාස්ත්‍රීය පර්යේෂන කෘතියක් යයි පෙනී සිටින පොතක එවන් ප්‍රකාශයක් පල විය හැකිය යන්න ම සිත් කම්පා කරවන සුලු ය.

ජර්මානු සමාජ ප්‍රජාතන්ත්‍රය කම්කරු පන්තියේ විප්ලවවාදී මහජන ව්‍යාපාරයක් නියෝජනය කලාවූ වර්ෂවල එහි ඉතිහාසය - එනම්, 1870 ගනන්වල සිට ප්‍රථම ලෝක යුද්ධය 1914 දී පුපුරා යාම දක්වා - යුදෙව්-විරෝධයට එරෙහිව ගෙන යන ලද අප්‍රතිහත අරගලයක ඉතිහාසය යි. කම්කරු පන්තිය තුල දේශපාලන අරගලයේ අවශ්‍යතා යුදෙව්-විරෝධී ප්‍රචාරයේ සියලු රූපයන්ට එරෙහි අනම්‍ය ආකල්පයක් ඉල්ලා සිටියේ ය. ප්‍රජාතන්ත්‍ර මූලධර්ම සහ සදාචාරාත්මක උත්සුකතාවයන්ට අමතරව, යුදෙව්-විරෝධය ජනවංචක ධනේශ්වර-විරෝධී වාචාල සමග බද්ධ කිරීම කම්කරු පන්තිය නො මග යවා එය දේශපාලන වශයෙන් මධ්‍යම පන්තියේ දේශපාලන නියෝජිතයන්ට යටත් කිරීමට දරන ලද ප්‍රයත්නයක් ලෙස සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය විසින් දැක ගන්නා ලදී.

ඇඩොල්ෆ් ස්ටෝකර් විසින් නිර්මානය කරන ලද විශදව ම යුදෙව්-විරෝධී ක්‍රිස්තියානු සමාජ කම්කරු පක්ෂය එවකට නීති විරෝධී වුව ද වැඩි වැඩියෙන් බලවත් වෙමින් පැවති සමාජ ප්‍රජාතන්ත්‍රයෙන් කම්කරු පන්තිය ඉවතට හැරවීම සඳහා යුදෙව්වන්ට පහර දීම පාවිච්චි කිරීමට යත්න දැරී ය. ස්ටෝකර්ට ප්‍රතිවිරුද්ධව, සමාජ ප්‍රජාතන්ත්‍රය යුදෙව් විරෝධයේ ප්‍රතිගාමී ස්වභාවය පිලිබඳව කම්කරු පන්තිය අධ්‍යාපන ගත කිරීම සඳහා බලගතු ව්‍යායාමයක යෙදුනි. 1881 මැතිවරනයේ දී සමාජ ප්‍රජාතන්ත්‍ර පක්ෂයේ ප්‍රකාශනයෙහි පක්ෂය මෙසේ කීය.

"යුදෙව් විරෝධී කලහවල සෝලිය ඇති කල හැකි වූයේ ප්‍රති-සමාජවාදී නීති වලට පසුවය. එය පොදු යුදෙව් සංහාරයක මට්ටමට වර්ධනය නුවූයේ නින්දිත ම චේතනා වලින් පැන නගින තුච්ඡ වැඩ වලට එරෙහිව සමාජ ප්‍රජාතන්ත්‍රවාදීන් කල් තබා අනතුරු ඇඟවූ නිසා ය."(7)

සමාජ ප්‍රජාතන්ත්‍ර පක්ෂයේ ප්‍රතිප්‍රහාරය කම්කරු පන්තිය මත ඉමහත් දේශපාලන හා සදාචාර බලපෑමක් ඇති කලේ ය. කම්කරුවෝ යුදෙව් විරෝධී රැස්වීම් කඩා බිඳ දැමූහ; යුදෙව් විරෝධයට පිලිතුරු දෙන බලගතු සංකේතයක් ලෙස යුදෙව් ජාතික සමාජවාදියෙකු ද ව්‍යාපාරිකයෙකු ද වූ පෝල් සිංගර් වැදගත් බර්ලින් දිස්ත්‍රික්කයේ සිය ඡන්ද අපේක්ෂකයා ලෙස සමාජ ප්‍රජාතන්ත්‍ර පක්ෂය විසින් තෝරා ගන්නා ලදී. 1887 මැතිවරනයේ දී නගරයේ අන් සෑම පක්ෂයක ම අපේක්ෂකයෙකුට වඩා සිංගර් ඡන්ද ලබා ගති.

"යුදෙව්-විරෝධයට විරුද්ධ වීම" "කම්කරු ව්‍යාපාරය තුල ගෞරවනීය පදක්කමක් බවට එවක පත්වී ය"යි එස්ට්‍රිච් ලියයි. "ජර්මන් සමාජ ප්‍රජාතන්ත්‍රය විසින් ඇඩොල්ෆ් ස්ටෝකර්ගේ බර්ලින් ව්‍යාපාරයට එරෙහිව ගෙන යන ලද දරුනු ව්‍යායාමය විසින් බොහෝ දුරට කම්කරු පන්තිය යුදෙව් විරෝධයට විරුද්ධව ප්‍රතිශක්තිකරනය කරන ලදී. එය කම්කරු ව්‍යාපාරය තුල යුදෙව් විරෝධය අහෝසි කලේ නැත. එහෙත් එය යුදෙව් විරෝධය දේශපාලනිකව නො වැදගත් තත්වයකට ඇද දැමීය......ස්ටෝකර්ට විරුද්ධ අරගලය සමාජ ප්‍රජාතන්ත්‍රවාදය උදෙසා අරගලයක් විය; කම්කරු පන්තියේ ප්‍රජාතන්ත්‍ර අයිතීන් තහවුරු කිරීමක් විය." (8)

යුදෙව් විරෝධයට එරෙහිව ජර්මානු සමාජ ප්‍රජාතන්ත්‍රවාදය කල අරගලය දිගු කාලයේ දී, එම සංවිධානය දෙස සැකයෙන් බැලූ ජර්මානු ජනගහනයේ එක් ස්ථරයක් තුල - එනම් යුදෙව් මධ්‍යම පන්තිය - තුල පුලුල් සහයක් දිනා ගති. සමාජවාදී ව්‍යාපාරයේ මුල්ම කාල පරිච්ඡේදය තුල ජර්මානු යුදෙව් බුද්ධිමතුන්ගෙන් කුඩා එහෙත් වැදගත් කොටසක් ඉටු කල වැදගත් ක්‍රියා කලාපය නො තකා තම කයෝර ආර්ථික අවශ්‍යතාවය උඩ ම පමනක් යුදෙව් මධ්‍යම පන්තියේ ධනේශ්වරයේ අතිමහත් වැඩි කොටස් සමාජ ප්‍රජාතන්ත්‍රයෙන් ඈත්ව සිටියහ. යුදෙව් සමාජ ප්‍රජාත්න්ත්‍ර පක්ෂය කෙරේ දැක් වූ ප්‍රතිවිරුද්ධ ආකල්පයට අතිරේක කරුනක් ද හේතු විය. එය නම්, සමහර විට අභ්‍යන්තර අනාරක්ෂිත භාවයක් තුලින් ජනිත වූ, කයිසර් විල්හෙල්ම් රජු කෙරේ පක්ෂපාතිත්වය හැකි තාක් දර්පිත අන්දමට විදහා දැක්වීම ය.

නව ශතවර්ෂය ආරම්භ වනවාත් සමඟ, යුදෙව්-විරෝධයට විරුද්ධව දෙගිඩියාවකින් තොරව නැගී සිටියේ සමාජ ප්‍රජාතන්ත්‍ර පක්ෂය පමනක් ය යන්න නො තකා හැරීම ජර්මානු යුදෙව්වන්ට කිසිසේත් ම කල නො හැකි විය. සත්තකින්ම ජර්මානු මන්ත්‍රන සභාවට අපේක්ෂකයන් ලෙස යුදෙව්වන් ඉදිරිපත් කල එකම දේශපාලන පක්ෂය වූයේ සමාජ ප්‍රජාතන්ත්‍ර පක්ෂය පමනි. 1903 මැතිවරනයේ දී එම පක්ෂය ප්‍රථම වතාවට ජර්මානු යුදෙව් ඡන්ද වලින් සැලකිය යුතු කොටසක් දිනා ගත්තේ ය.

මේ අතර දී කිව යුතු කරුනක් නම්, මෙය මහාචාර්ය ගෝල්ඩ්හාගන් 1933ට පෙර ජර්මනියේ දේශපාලන ඉතිහාසය පිලිබඳව සඳහන් නොකරන කරුනක් බවය.

සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ අරගලයේ ප්‍රතිඵලයක් ලෙස යුදෙව් විරෝධී පක්ෂයන්ගේ දේශපාලන බලපෑම, 1980 මැද ගනන් වල සිට පලමු වන ලෝක යුද්ධය පිපිරී ගිය අවස්ථාව දක්වා වූ කාලය තුල ප්‍රපාතයට ම පිරිහී ගියේ ය. විසි වන සියවසේ ප්‍රථම වර්ෂ තුල දී යුදෙව් විරෝධයේ අතිශයින් ම ප්‍රචන්ඩ පිපිරීම් සිදු වූයේ ජර්මනිය තුල හෝ ප්‍රන්සය තුල නොව, රුසියාවේ දී ය.

## රුසියාවේ යුදෙව්-විරෝධය

රුසියාවේ සිදු වූ ලේ වැකි මහා යුදෙව් සංහාරයන් වනාහි වර්ධනය වී ගිය කම්කරු පන්තියේ විප්ලවවාදී ව්‍යාපාරයට සාර් පාලනය විසින් දක්වන ලද ඍජු ප්‍රතික්‍රියාවකි. ආන්ඩුව කම්කරු පන්තිය ත්‍රස්ත කිරීම සඳහා 'බ්ලැක් හන්ඩ්‍රඩ්' නම් ලද දක්ෂිනාංශික අර්ධ-මිලිටරි කන්ඩායම් සංවිධානය කලේ ය.

ඕර්ලැන්ඩෝ ෆිගේස් නම් ඉතිහාසඥයා ලියන පරිදි: "යුරෝපයේ යුද්ධ දෙක අතරතුර සමයේ ෆැසිස්ට් ව්‍යාපාර වලට මෙන් බ්ලැක් හන්ඩ්‍රඩ් කන්ඩායමට ද වැඩියෙන් ආධාර ලැබුනේ නවීකරනයේ හා ප්‍රතිසංස්කරනයේ ප්‍රතිඵලයක් ලෙස සමාජය තුල තමන්ට තිබුනු සුලු තැන ද නැති වී යමින් සිටි, නැතහොත් නැති වී යතැයි බියෙන් සිටි අපේක්ෂාභංග ලූම්පන් කන්ඩායම්වලිනි: එනම්, තාවකාලික කම්කරුවන් ලෙස නගර වලට ඇද වැටුනු නට්ටම් වූ ගොවියන්, මහා ජාවාරම් වල තරඟකාරිත්වය නිසා මිරිකී ගිය කුඩා කඩ කාරයන් හා හස්ත කර්මාන්ත කරුවන්, සුලු නිලධාරීන් හා පොලිස්කාරයන් සහ 'අලුත නැගපු' කම්කරුවන්, ශිෂ්‍යයන් හා යුදෙව්වන් විසින් සාර් රජුට දෙවියන්ගෙන් ලැබුනු බලයට අභියෝග කෙරෙනු දැකීමෙන් කම්පාවට පත් වූ සියලු වර්ග වල තැබෑරුම් ජාතිමාමකයන් යනාදීන්ගෙනි." (9)

දෙවන නිකොලස් සාර්ගේ පාලන තන්ත්‍රය 1905 විප්ලවවාදී ව්‍යාපාරයට ප්‍රතිචාර දැක් වූයේ භීෂන රලයක් ලිහා හරිමිනි. මෙහි ප්‍රධාන ඉලක්කයක් වූයේ යුදෙව්වන් ය. ප්‍රජාතන්ත්‍රවාදී සංස්ථා පිහිටුවීමට පොරොන්දු වූ සාර්ගේ 1905 ඔක්තෝබර් ප්‍රකාශනයෙන් ඉක්බිති සති දෙකේ දී යුදෙව් විරෝධී සංහාර 690ක් වාර්ථා විය. මෙම කාල පරිච්ඡේදයේ දී යුදෙව්වන් 3000ක් මරා දමන ලදී. ඔඩෙස්සාවේ සංහාරයක් යුදෙව්වන් 800ක ජීවිත විනාශ කලේ ය. 500කට තුවාල කරන ලද අතර ලක්ෂයක් ජනයාට උන්හිටි තැන් නැති කරන ලදී. මෙම සංහාර ආන්ඩුවේ ඍජු ආධාරයෙන් සිදු කරන ලද බව වැඩි කල් යාමට පෙර තහවුරු කෙරුනි. ඒවායේ දේශපාලන යන්ත්‍රනය එවක සමාජවාදී පුවත් පතක මෙසේ විස්තර කරන ලදී:

"පැරනි සුපුරුදු පින්තූරයකි! පොලීසිය කල් තබා ම සංහාරය සංවිධානය කරයි. පොලීසිය එය උසිගන්වයි. ආන්ඩුවේ කාර්යාලවල යුදෙව් ඝාතනයක් ඉල්ලා පත්‍රිකා මුද්‍රනය කරනු ලැබේ. සංහාරය ඇරඹෙන විට පොලීසිය අකර්මන්‍යව බලා සිටී. හමුදාව ද නිශ්ශබ්දව කලු ශතකයන්ගේ වැඩ කටයුතු දෙස බලා සිටී. මෙම පොලීසියම සංහාරකයන්ට නඩු පැවරීමේ ප්‍රෝඩාවක් ක්‍රියාත්මක කරයි. නිලධාරීන් විසින් සංහාරකයන්ට එරෙහිව පවරන ලද නඩු සෑම විටම එකම ආකාරයකින් ක්‍රියාත්මක වේ. ඒවා දිගටම ඇදී යයි. එකම සංහාරකයෙක් වත් වැරදිකරු යැයි තීන්දු නොකෙරේ. සමහර විට බැට කෑමට හා කැපීම් කෙටීම් වලට ලක් වූ යුදෙව්වන් ද බුද්ධිමතුන් ද උසාවිය ඉදිරියට ඇදගෙන එනු ලැබේ. මාස ගනන් ගත වේ - ඉතින්, ඊලඟ සංහාරය එලඹෙන තෙක් මේ පැරනි හැමදාම අලුත් වන කතාව අමතක කරනු ලැබේ." (10)

1906 දී ලියන ලද මෙම ලිපියේ කතෘ ලෙනින් ය. ඓතිහාසික කරුනු කඩා වැදීමෙන් ජර්මානු යුදෙව්-විරෝධය තම න්‍යාය බිඳ වැටෙන්නට ඉඩ නො දෙන ගෝල්ඩ්හාගන් තුන් වන රයිකය (හිට්ලර් පාලනය) පිහිටුවීට පෙරාතු යුරෝපයේ සිදු වූ භයංකර යුදෙව් විරෝධී ප්‍රචන්ඩ පිපිරීම් වලින් දරුනුතම එක ගැන මොන ම සඳහනක් හෝ නොකොට මග හරී.

## ජර්මනියේ දේශපාලන යුදෙව්-විරෝධය යලි පන ගැසීම

පලමු වන ලෝක යුද්ධයෙන් පසු ජර්මනියේ විප්ලවය පුපුරා ගොස් හොහෙන්සොලර්න් රාජාන්ඩුව බිඳ වැටීමත් සමඟ යුදෙව් විරෝධය දේශපාලන අවියක් ලෙස යොදා ගැනීම යලිත් වරක් බරපතල සාධකයක් බවට පත් විය. නාසි ප්‍රචාරයේ දී ප්‍රධාන ක්‍රියා කලාපයක් ඉටු කල යුදෙව් විරෝධයේ බලය, සුලු ධනේශ්වරයේ අපේක්ෂාභංගයට ද කම්කරු පන්තියේ දේශපාලන නොමඟ යාමට ද ඍජුව අනුපාතික විය. ජර්මනිය යුද්ධය පරාජය වීමට පසුව එලඹි සිද්ධීන් නිසා සුලු ධනේශ්වරය කම්පාවට පත්වී තිබුනි. ගෙල මිරිකනු ලැබූ විප්ලවයක් මත ගොඩනැගුනු වයිමාර් සමූහාන්ඩුව අර්බුදයෙන් අර්බුදයට ගමන් කලේ ය.

ට්‍රොට්ස්කි මෙසේ ලිවීය: "පශ්චාත් යුධ කාලීන වියවුල හස්ත කර්මාන්තකරුවන්ට ද තොරොම්බල්කරුවන්ට ද සිවිල් නිලධාරීන්ට ද කම්කරුවන්ට තරම් ම නො අඩුව පහර එල්ල කලේ ය.... යුද්ධය, පරාජය, වන්දි, උද්ධමනය, රූර් පෙදෙස ප්‍රන්සය විසින් අල්ලා ගැනීම, අර්බුදය, දරිද්‍රතාව, උමතුව යන මේ සියල්ල අලලාගත් වාතාවරනය තුල සුලු ධනේශ්වරය මෙන්ම රැවටු සියලු පක්ෂයන්ට එරෙහිව නැගී සිටියේ ය. කවර කලෙකවත් බංකොලොත් බවෙන් ගොඩ නො ආ කුඩා දේපල හිමියන් ද, සරසවි ගිය එහෙත් රැකියා හෝ සේවා දායකයන් නො ලත් ඔවුන්ගේ පුත්‍රයන්ගේ ද දෑවැද්ද හෝ මනාලයන් නොලත් ඔවුන්ගේ දූවරුන්ගේ ද තියුනු මැසිවිලි වලින් ඉල්ලා සිටිනු ලැබුවේ ස්ථාවරත්වය හා යකඩ හස්තයකි. (11)

තමන් කම්කරු පන්තිය තුලට ඇද වැටෙතැයි නිරතුරුව බියට පත්ව සිටි මෙම ස්තරයේ වියරු බව, කාන්සාව හා වේදනා වලට ප්‍රකාශනයක්, හිට්ලර් විසින් සම්පාදනය කරන ලදී. පහල මධ්‍යම පන්තියෙන් උපන් හෙතෙම තමාගේ චරිතය හැඩ ගැසූ මුල් අවුරුදු වියනාවේ ගත කලේ ය. ඔහුගේ ලෝක දෘෂ්ටිය ලාභ දක්ෂිනාංශික කුනු අගල් පුවත් පත් විසින් හැඩ ගසනු ලැබිනි. කම්කරු පන්තිය ද සමාජවාදය ද කෙරේ තම වෛරය ඔහු අත් කර ගත්තේ ද එහි දී ය. කොන්ඩේ හෙයිඩන් නැමති ෆැසිස්ට්-විරෝධී තීක්ෂන ජර්මානු ලේඛකයාට අනුව හිට්ලර්ගේ යුදෙව්-විරෝධය, කම්කරු පන්තිය කෙරේ හිට්ලර් දැක් වූ සර්ව-භක්ෂක වෛරයේ අතුරු ඵලයක් විය.

හිට්ලර්, "ශක්තිය නිෂ්පාදනය කරා නිත්‍ය ලෙස පරිවර්තනය කිරීමට කැප වූ මානව පැවැත්මේ සමස්ථ ක්ෂේත්‍රයට ම වෛර කලේ ය; නිෂ්පාදන සන්තතිය තුලට හසුව ඒ තුල දී තලා දැමීමට ඉඩ දුන්නා වූ මිනිසුන්ට ඔහු වෛර කලේ ය. ඔහුගේ මුලු ජීවිතය පුරාම ඔහුට කම්කරුවන් පෙනී ගියේ භීතියේ සංකේත රූපයක්, කාලකන්නි පිලිකුල් සහගත කයක් ලෙස ය.... කථික වේදිකාවේ සිටගෙන දෑතේ වැඩ කරන්නන්ට චාටු වශයෙන් ඔහු පසු කලෙක කී සෑම දෙයක් ම තනිකර බොරුම විය."

හිට්ලර් යුදෙව්වන් කෙරේ දැක්වූ රකුසු ග්‍රස්තිය වටහා ගත හැකි යතුර ඇත්තේ මෙතැන ය. මයින් කාම්ෆ් [Mein kampf- මගේ හටන] නම් සිය කෘතියේ දී හෙතෙම තමා යුදෙව් විරෝධය කරා පරිවර්තනය වූයේ කම්කරු ව්‍යාපාරය සමග ගැටීම තුලින් යයි හිට්ලර් පැහැදිලි කලේ ය. ඔහුට ප්‍රථමයෙන් ම යුදෙව්වන් හමු වූයේ කම්කරුවන් අතරදී ය. බොහෝ යුදෙව්වන් කම්කරු ව්‍යාපාරය තුල ප්‍රමුඛ ක්‍රියාකලාපයක් ඉටුකල බව ඉක්බිත්තෙන් දැනගත් කල හෙතෙම විශ්මයට පත් විය. "ඔහුට ආලෝකය උපනැ"යි හෙයිඩන් ලිවී ය. " හදිසියේ ම 'යුදෙව් ප්‍රශ්නය' පැහැදිලි විය....... කම්කරු ව්‍යාපාරය ඔහුට එපා වූයේ එය යුදෙව්වන් විසින් මෙහෙයවනු ලැබූ නිසා නොවේ; ඔහුට යුදෙව්වන් එපා වූයේ ඔවුන් කම්කරු ව්‍යාපාරය මෙහෙය වූ හෙයිනි."

එක් දෙයක් සහතික යයි හෙයිඩ්න් නිගමනය කලේ යඃ "ඇඩොල්ෆ් හිට්ලර්ගේ යුදෙව් විරෝධය මොලවාලූයේ ධනපති රොත්ස්චයිල්ඩ් නොව සමාජවාදී කාල් මාක්ස් විසිනි."

හෙයිඩ්න් ලියූ හිට්ලර්ගේ ජීවන චරිතය කියවීම මගින් මහාචාර්ය ගෝල්ඩ්හාගන්ට බුද්ධිමය වශයෙන් වාසියක් ලබා ගැනීමට තිබුනි. නමුත්, ඔහු එසේ කලේ නම්, ඔහු ලිවීමට ඉඩ තිබුනේ මුලුමනින් ම වෙනස් කෘතියකි. එමගින් ඔහුට *හිට්ලර්ගේ ආසක්ත අලුගෝසුවෝ* යන කෘතියෙන් ඔහු ලැබූ තරම් මුදල් කන්දරාවක් නොලැබී යන්නට ඉඩ තිබුනි. ජීවිතයේ දී අප සියලු දෙනා ම දෙකින් එක තෝරා ගන්නෙමු.

**අධෝ සටහන්ඃ**


03. රොබට් එස් විස්ට්‍රිච් *Socialism and the Jews: The Dilemmas of Assimltion in Germany and Austria-Hungary* (සමාජවාදය හා යුදෙව් ජනයාඃ ජර්මනිය හා ඔස්ට්‍රියා-හංගේරියාව තුල අවශෝෂනය පිලිබඳ උභතෝකෝටික ගැටලු) (ලන්ඩන් සහ ටොරොන්ටෝඃ ඇසෝෂියේටඩ් යුනිවර්සිටි ප්‍රෙසස්, 1987) 56 පි.

04. විස්ට්‍රිච් විසින් උපුටා දක්වනු ලැබ ඇත. 53 පි.

05. සිව් ස්ටර්න්හෙල්ගේ උපුටා දැක්වීමක්, *Neither Right Nor Left: Fascist Ideology in France* (දකුනත් නො වේ, වමත් නො වේඃ ප්‍රන්සය තුල ෆැසිස්ට්ඃ ප්‍රින්ස්ටන් යුනිවර්සිටි පෙස්, 1986)45-46 පි.

06. එම,46 පි.

07. විස්ට්‍රිච් උපුටා දැක්වීක්. 94 පි.

08. විසිට්‍රිච් 94-108 පි.

09. ඕර්ලන්ඩො ෆිග්ස්, *A People's Tragedy: A History of the Russian Revolution* (මහජනයාගේ ඛේදාන්තයක්ඃ රුසියානු විප්ලවයේ ඉතිහාසයක්), (නව් යෝර්ක්ඃ වයිකිං ප්‍රෙස්, 1996), 196-97 පි.

10. වි. අයි. ලෙනින්, එකතු කල කෘති, වෙලුම 10 (මොස්කව්ඃ ප්‍රගති ප්‍රකාශකයෝ, 1972) 509 පි.


© www.wsws.org